දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011- 2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: PSC/APL/6/90/2022 - II
ඔබේ අංකය / உமது இல. / Your No.:

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

දිනය / திகதி / Date: 2023.04. 06

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

**ඒකාබද්ධ සේවාවල නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2023**

ඒකාබද්ධ සේවාවන්හි තනතුරුවල සේවය කරනු ලබන නිලධාරීන්ගේ 2023 වාර්ෂික ස්ථානමාරුවලට අදාළව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ, මේ වන විට අදාළ පාර්ශව වෙත දැනුම් දී ඇත.

02. කෙසේවතුදු ඒකාබද්ධ සේවාවන්හි නිලධාරීන්ගේ 2023 වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත විවිධ පාර්ශව වෙතින් ඉල්ලීම් ඉදිරිපත් වන පසුබිම තුළ ඒකාබද්ධ සේවාවන්හි 2023 වාර්ෂික ස්ථානමාරු යටතේ ලබා දී ඇති ඇතැම් ස්ථානමාරු චක්‍ර ක්‍රියාවට නැංවිය නොහැකි වීම මත අදාළ ස්ථාන මාරු චක්‍රවල සිටින ස්ථාන මාරු වී යාමට අපේක්ෂිත අනෙකුත් නිලධාරීන් අගතියට පත් වී ඇත.

03. වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ සම්බන්ධයෙන් අතෘප්තියට පත් වන නිලධාරීන්ට ඒ සම්බන්ධයෙන් 2002 අංක 04 දරණ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනත අනුව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත අභියාචනා කිරීමේ හැකියාව පවතී. කෙසේවතුදු එම අභියාචනා සම්බන්ධයෙන් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ තීරණ ලැබෙන තෙක් අදාළ ස්ථාන මාරු චක්‍ර එලෙසින්ම ක්‍රියාත්මක විය යුතු බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දැනුම් දීම සඳහා යොමු කර ඇති ලිපියෙහි ද සඳහන් කර ඇත.

04. එසේම ඒකාබද්ධ සේවාවන්හි තනතුරුවල සේවය කරන නිලධාරීන්ගේ 2023 වාර්ෂික ස්ථානමාරු සම්බන්ධයෙන් නිකුත් කර ඇති ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 02/2022 හි 5.2.ii වගන්තිය මගින් යම් ආයතනයක පවතින සේවා අවශ්‍යතාවය මත කිසියම් නිලධාරියෙකු තවදුරටත් එම ආයතනය තුළ රඳවා ගැනීමට අවශ්‍ය නම් ඒ සඳහා වන විධිවිධාන සළසා ඇති බැවින්, වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ ද දැනුම් දීමෙන් අනතුරුව ඊට අදාළ ඉල්ලීම් නැවත නැවතත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම ගැටළු සහගත බවද

05. ඒ අනුව ඉහත සියළු කරුණු සැලකිල්ලට ගෙන ඒකාබද්ධ සේවයේ තනතුරුවල සේවය කරන නිලධාරීන්ගේ 2023 වාර්ෂික ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් නැවත නැවත රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉල්ලීම් ඉදිරිපත් නොකරන ලෙස සහ 2023 වාර්ෂික ස්ථාන මාරු යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අවසන් වශයෙන් ලබා දී ඇති නියෝග ප්‍රකාරව ඔබ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ සේවය කරන ස්ථාන මාරුවීම් ලබා ඇති නිලධාරීන් විධිමත් පරිදි සේවයෙන් නිදහස් කිරීමට කටයුතු කරන මෙන් එම කොමිෂන් සභාවේ නියමය පරිදි කාරුණිකව දන්වා සිටිමි.

**තනූජා මුරුගේෂන්,**
වැඩබලන ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

පිටපත - ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් - කා. දැ. ගැ. පි. සහ අ. ක. ස.